# අපේ කාලේ කතන්දර



රසික සූරියආරච්චි

හෝඩියේ පන්තියේ බල්ලා සහ කොල්ලා සත්‍ය සිදුවීමක් ඒ ආකාරයෙන් විස්තර කිරීම සහ අත්දැකීමක් පදනම් කරගෙන නිර්මාණාත්මක ලියවිල්ලක් කිරීම යනු මට නම් අහසට පොළොව මෙන් දුරස්තර කර්තව්‍යයන් දෙකකි. සිදුවීමක් විස්තර කිරීමේ දී, උපමා, උපමේය, උපහාසය, අලංකාර යනාදිය යොදා රචනය රසවත් කළ හැකි වුව ද, නිර්මාණකරණය ඒ ආකාරයේ පහසු කටයුත්තක් නොවන බව මගේ අත්දැකීමයි.



විවිධාකර අත්දැකීම් පදනම්ව මේ වන විට මා ලියා පළ කර ඇති දහසක් පමණ වූ ලේඛන පදනම් කරගෙන කෙටිකතා සීයක් ලියන්නෙමි යැයි මා දැන් මාස තුනකට කලින් අදිටන් කර ගත්ත ද, තවමත් මා අතින් එවැනි එකදු නිර්මාණයක් හෝ කෙරී නැත.

නිර්මාණාත්මක ලේඛනය යනු ලේසි පහසු කටයුත්තක් නොවෙතත්, අහම්බෙන් නමුත්, නිර්මාණාත්මක ලේඛනය පිළිබඳ මට මුල්ම පාඩම ලැබුණේ මීට දශක පහකට පමණ ඉහත අතීතයක දී, හෝඩියේ පන්තියේ දී බව මට මේ මොහොතේ සිහිවේ.

මේ ඒ මතකයයි.

එදා හෝඩියේ පන්තියේ දී අප අකුරු ලීවේ, චිත්‍ර ඇන්දේ, ගල්ලෑල්ල නම් වූ ලීයෙන් සාදන ලද රාමුවකින් ආරක්ෂා වූ, කාලවර්ණ පාෂාණමය මුහුණත් දෙකකින් සමන්විත, පැතලි උපකරණයක් මත ය. එය මෙකල ප්‍රචලිතව ඇති ටැබ්ලට් නම් ඉලෙක්ට්‍රොනික මෙවලමේ මුල් අදියරේ උපකරනයක් බව කිව හැකිය.

ගල්ලෑල්ලේ අකුරු ලිවීමට, චිත්‍ර ඇඳීමට, එදා අප භාවිතා කළේ ගල්කූරකි. එය මෙකල ස්ටයිලස් නමින් හැඳින්වෙන මෙවලමේ මුල් අදියරේ උපකරණයයි.

ගෙදර වැඩ හෝ පැවරුම් යනාදිය පිළිබඳව අප එකල අසා නොතිබුණ ද, උදෑසන පන්තියේ ගුරුවරියට පෙන්වීම සඳහා ගල්ලෑල්ලේ චිත්‍රයක් ඇඳගෙන යාමට, අත් අකුරු පුහුණුව පෙන්වීම සඳහාත්, භාෂාව ඉගෙනීම පෙන්වීම සඳහාත්, වචන හෝ වාක්‍ය හෝ පිළිවෙළට ලියාගෙන යෑමට, අපට එකල උපදෙස් ලැබී තිබුණි.

මා ලියාගෙන යන දේ කුමක් වුවද, එයට අති විශාල හරියකින් ප්‍රතිචාර දැක්වීම අපේ පන්තිය භාර ප්‍රඥාවතී ටීචර් ගේ සිරිත විය. අකුරක හැඩයේ වරදක්, වචනයක අක්ෂර වින්‍යාසයේ වරදක් හෝ වාක්‍යයක ව්‍යාකරණ වරදක් තිබුණේ නම්, ඇය එය නිවරද කරන්නට ඉඩ තිබුණි. නමුත්, පෙරදා රාත්‍රියේ නිවසේ දී ගල්ලෑල්ලේ ලියා දෙමව්පියන්ට පෙන්වන දෙයක වරදක් පසුදා උදෑසන වන විට තිබෙන්නට ඉඩක් නැත.

එක් දිනයක උදෑසන අවදිව පාසල් යන්නට සූදානම් වෙමින් සිටි මට පෙනුණේ, කුමක් හෝ හේතුවක් නිසා, පෙර දින රාත්‍රියේ මා ගල්ලෑල්ලේ කිසිවක් ලියා නොමැති බවයි.

චිත්‍රයක් අඳින්නට ද වෙලාවක් නොමැත. අපේ නිවසට අල්ලපු වත්තේ විසූ ආනන්ද ජයතිලක සමග මා කොස්සින්න ශ්‍රී ශීලානන්ද කණිෂ්ඨ විද්‍යාලය වෙත පා ගමනින් යාම අරඹන්නේ උදෑසන හතට ය. එය අඩ සැතපුමක පමණ දුරකි.

ලියන්නට වාක්‍යයක් අසා ගන්නට තාත්තා ද නොමැත. බොල්ලතේ පාසලක සේවය කළ රජයේ ගුරුවරයෙකු වූ ඔහු නිවසෙන් පිටත්වන්නේ උදෑසන හයටත් පෙර ය.

නිවසේ කිසියම් කාර්යයක නිරත වෙමින් සිටි අම්මා වෙත ගිය මම, "අම්මේ මොනවා හරි කියන්න මට ගල්ලෑල්ලේ ලියා ගෙන යන්න" කියා ඇගෙන් ඉල්ලීමි.

"අනේ පුතේ, අර නැන්දාගෙන් අහගන්න කෝ!" යැයි අම්මා පැවසූයෙන් මම නැන්දා වෙත ගියෙමි. නැන්දා මට ලියන්නට කීවේ මේ වාක්‍ය යුගලයි!

- බල්ලා බත් කයි.
- කොල්ලා හූ කියයි.

එවෙලේ හදිසියෙන් ඒ වාක්‍ය දෙක ගල්ලෑල්ලේ ලියාගෙන පාසලට ගිය මට ප්‍රඥාවතී ගුරුවරිය ගෙන් ගල්ලෑල්ල පුරා විසිරී ගිය විශාල හරියක් ලැබෙන්න ඇත.

මා මුලින් ම නිර්මාණාත්මක ලියවිල්ල ඉගෙන ගත්තේ එදා යැයි පසු කාලයක මේ සිදුවීම ගැන සිතන විට මට වැටහී ගියේ ය.

- කොල්ලා බත් නොකා බල්ලා බත් කෑවේ ඇයි?
- බල්ලා හූ නොකියා කොල්ලා හූ කීවේ ඇයි?
- බල්ලා කෑවේ කොල්ලා ගේ බත් ටික ද?
- කොල්ලා හූ කීවේ, ඒ දැක කෝපයෙන් ද?

නැන්දා ගේ ඒ වාක්‍ය යුගල නිර්මාණයේ තෝතැන්නකි!

ACCOUNTING TUTORING
VCE/TAFE/UNI

- Individual classes
- Small group classes
- Any accounting subject
- Flexible time and home visits
- Reasonable rates
- Based in Dandenong

*Popular tutor and former government school teacher in Sri Lanka.*

Rushan Silva
MBA/MPA (Deakin)
B.Sc (B.Adm) sp.

Contact : 0430297807 E-mail : maths4kids@outlook.com

සාර්ථක ව්‍යාපාරයකට අනගි අවස්ථාවක්

Bundoora හි Latrobe විශ්ව විද්‍යාලයට ඉතා ආසන්නයේ විශ්වාසය දිනාගත් පාරිභෝගික ජාලයක්ද සහිත ඉතා සාර්ථක Fish and Chips වෙළඳ සැලක් විකිණීමට තිබේ. ශ්‍රී ලාංකිය සහ ඉන්දියානු ආහාර වර්ග එක්කර ව්‍යාපාරය තවත් දියුණු කිරීමේ හැකියාවද ඇත.

නිර්ව්‍යාජ ගැණුම්කරුවන් පමණක් විමසන්න
0432 077 038